# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාළ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

**2022 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පසු බෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ඔක්තෝම්බර් මාසයේ දී ඉකුත් මාසයට සාපේක්ෂව පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 ඔක්තෝම්බර් මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.2කින් පහළ යමින් 38.4ක අගයක් වාර්තා කළ අතර, මේ සඳහා සියලුම උප-දර්ශකයන්ගේ පහළ යෑම හේතු විය.

විශේෂයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදන සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් ඉල්ලුම් පහල යාම හේතු විය. පාරිභෝගිකයන්ගේ මිල දී ගැනීමේ හැකියාව අඩු වීමත් සමග මෙලෙස ඉල්ලුමෙහි සැලකිය යුතු අඩු වීමක් සිදු වූ බව ආහාර හා පාන නිෂ්පාදන අංශය නියෝජනය කරන බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. තවද, විශේෂයෙන්ම උතුරු ඇමරිකානු සහ යුරෝපීය වෙළඳපොළ වෙත අපනයන සිදු කරන ඇඟළුම් අංශයේ නිෂ්පාදකයින් ඇතුළු අපනයනාභිමුඛ කර්මාන්තවල යෙදී සිටින නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි, එම ආර්ථිකයින්හි මන්දගාමීත්වයක් ඇතිවෙතැයි පවතින බිය හේතුවෙන් අපනයන ඉල්ලුමෙහි ද පහත වැටීමක් වාර්තා විය. එමෙන්ම, ඉහළ යෙදවුම් පිරිවැයක් මධ්‍යයේ අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළුවට ද නිෂ්පාදකයින් තවදුරටත් මුහුණ දෙමින් සිටී. තවද, 2022 ඔක්තෝබර් මාසයේ දී සේවා නියුක්තියේ පහත වැටීමක් වාර්තා වූ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීමට සමගාමීව තොග මිල දී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, පෙර මාසයට සාපේක්ෂව 2022 ඔක්තෝබර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු විය.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **42.6** | **38.4** | **-** | වැඩි වේගයකින් පහළ යෑමක් |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 37.5 | 33.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 39.0 | 32.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 50.5 | 47.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 38.9 | 35.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.0 | 49.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉල්ලුම් අංශයේ පවතින බාධාවන් ඉදිරි කාලය තුළ දී ද පවතිනු ඇතැයි අපේක්ෂාවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් පහත මට්ටමක පැවතුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**38.4**

**2022 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.2 ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4කින් පහළ යමින් 2022 ඔක්තෝබර් මාසයේ දී 49.4ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 ඔක්තෝබර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉන්දියාව සහ සිංගප්පූරුවේ වැඩි වේගයකින් ද එක්සත් ජනපදය සහ රුසියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 නොවැම්බර් 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 47.9ක් දක්වා කඩඉම් මට්ටමින් පහතට වැටුණු අතර,** මේ සඳහා නව ව්‍යාපාර, සේවා නියුක්තිය සහ නිමකිරීමට නියමිත කාර්යයන්වල සිදු වූ පහළ යැම් හේතු විය. එසේ වුවද, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

ප්‍රධාන වශයෙන්, දේපළ වෙළඳාම, රක්ෂණ, සහ තැපැල් හා කුරියර් සේවා යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2022 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2022 ඔක්තෝබර් මාසයේ දී නව ව්‍යාපාර සුළු වශයෙන් පහත වැටුණි.


ආර්ථික තත්ත්වය වැඩිදියුණුවීමට අනුකූලව සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව සිව්වන මාසයටත් ඔක්තෝබර් මාසයේ දී ඉහළ ගියේය. ඒ අනුව, අනෙකුත් පෞද්ගලික සේවා, මූල්‍ය සේවා, අධ්‍යාපන, වෘත්තීය සේවා සහ වැඩසටහන් හා විකාශන කාර්යයන් යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් පෙර මාසයට සාපේක්ෂව ඉහළ යැම් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවීම, එකතු කළ අගය මත බද්ද (VAT) වැඩි කිරීම සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) පැනවීම හේතුවෙන්, විශේෂයෙන්ම, තොග හා සිල්ලර වෙළඳාම සහ දේපළ වෙළඳාම යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් පහත වැටුණි.

සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා සංක්‍රමණ වීම් සහ විශ්‍රාම ගැනීම් ඉහළ යෑමට අමතරව නව බඳවාගැනීම් අත්හිටුවීම හේතුවෙන් ඔක්තෝබර් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, නව ව්‍යාපාරවල අඩුවීම මධ්‍යයේ නිමකිරීමට නියමිත කාර්යයන් තවදුරටත් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**47.9**

**2022 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.3ක පහළ යෑමකි.**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.2** | **47.9** | **-** | **ඉහළ යැමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 56.3 | 49.0 | - | ඉහළ යැමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 58.3 | 54.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 39.6 | 33.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.0 | 44.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.8 | 57.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික තත්ත්වයේ වැඩිදියුණුවීම පිළිබඳ බලාපොරොත්තු සහ එළැඹෙන උත්සව සමය හේතුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2022 ඔක්තෝබර් මාසයේ දී තවදුරටත් වර්ධනය විය. කෙසේ වෙතත්, සැපයුම් සම්බන්ධව පවත්නා දුෂ්කරතා, සෘජු හා වක්‍ර බදු, ප්‍රාග්ධන පිරිවැය සහ යෙදවුම් මිල ඉහළ යෑම ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් අඛණ්ඩව සඳහන් කරනු ලබයි.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 සැප්තැම්බර් මාසයේ පැවති 50.0 සිට 2022 ඔක්තෝබර් මාසයේ දී 49.2ක් වාර්තා කළේය.

ඉන්දියාව සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 ඔක්තෝබර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, චීනය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 නොවැම්බර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.